| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.21 පැය 0030 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/791/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු</u>

## 01. මනුෂ්‍ය ඝාතනයක් - හංවැල්ල පොලිස් වසම.

2025.04.20 වන දින අළුයම් කාලයේ හංවැල්ල පොලිස් වසමේ පැල්පොල ප්‍රදේශයේදී තියුණු ආයුධයකින් පහරදීමෙන් තුවාල ලැබූ පිරිමි පුද්ගලයෙකු අවිස්සාවේල්ල රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇති බවට හංවැල්ල පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමශර්න ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 40 ක් වූ වැලිකන්න, වග ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු මත්පැන් සාදයකට සහභාගී වී සිටියදී තවත් පුද්ගලයෙකු සමඟ ඇති වූ බහින් බස් වීමක් දුර දිග යාමෙන් මරණකරුට අනෙක් පුද්ගලයා විසින් තියුණු ආයුධයකින් පහරදී ඇති අතර තුවාලකරු සාලාව රෝහලට ඇතුලත් කිරීමෙන් පසු වැඩිදුර ප්‍රතිකාර සඳහා අවිස්සාවේල්ල රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

මෘත ශරීරය අවිස්සාවේල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අපරාධයට සම්බන්ධ **වයස අවුරුදු 61 වන තුම්මෝදර ප්‍රදේශයේ පදිංචි සැකකරු** අත්අඩංගුවට ගෙන ඇත. හංවැල්ල පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

## 02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - වැල්ලම්පිටිය පොලිස් ස්ථානය.

2025.04.20 වන දින සවස් කාලයේ වැල්ලම්පිටිය පොලිස් වසමේ සිංහපුර ප්‍රදේශයේදී වැල්ලම්පිටිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 400 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 28 ක් වන කොලොන්නාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වැල්ලම්පිටිය පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 03. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගම්පහ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.

2025.04.20 වන දින සවස් කාලයේ ගම්පහ පොලිස් වසමේ ඉදිගොල්ල ප්‍රදේශයේදී ගම්පහ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 270 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ගම්පහ පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 34 ක් වන ඉහලගම, ගම්පහ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගම්පහ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. ගංජා වගා කළ සැකකරුවෙකු අත්අඩංගුවට - බණ්ඩාරවෙල කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.

2025.04.20 වන දින දහවල් කාලයේ බණ්ඩාරවෙල පොලිස් වසමේ කොස්ලන්ද ප්‍රදේශයේදී බණ්ඩාරවෙල කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **තම නිල නිවස අසල ගංජා වගා කල වෛද්‍යවරයෙකු ගංජා ගස් 14 ක් සමඟ** අත්අඩංගුවට ගෙන බණ්ඩාරවෙල පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 33 ක් වන කහත්තේවෙල, බණ්ඩාරවෙල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බණ්ඩාරවෙල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

වැටලීමට අදාල ඡායාරූප කිහිපයක් හා වීඩියෝ පටයක් මේ සමඟ යොමුකරමි.

## 05. මෙරට නිෂ්පාදිත ගිනි අවියක සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - අහුන්ගල්ල පොලිස් ස්ථානය.

2025.04.20 වන දින සවස් කාලයේ අහුන්ගල්ල පොලිස් වසමේ වැලිවත්ත ප්‍රදේශයේදී අහුන්ගල්ල පොලිස් ස්ථනයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 52 ක් වන වැලිවත්ත, බලපිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අහුන්ගල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

වැටලීමට අදාල වීඩියෝවක් හා ඡායාරූපයක් මේ සමඟ යොමු කරමි.

## 06. විදෙස් රටක නිෂ්පාදිත ගිනි අවියක් හා එම පතොරම් ගැබක් අත්අඩංගුවට - පිටිගල පොලිස් ස්ථානය.

2025.04.20 වන දින සවස් කාලයේ පිටිගල පොලිස් වසමේ තල්ගස්වල වත්ත ප්‍රදේශයේදී පිටිගල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **විදෙස් රටක නිෂ්පාදිත ගිනි අවියක් හා එම හිස් පතොරම් ගැබක්** අත්අඩංගුවට ගෙන ඇත.

මෙම ගිනි අවිය දැනට බන්ධනාගාර ගතව සිටින සැකකරුවෙකුගේ බවට පොලිසිය සැක කරනු ලබන අතර පිටිගල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**